


## වෙසක් දිනයේ හැම තැන හරි ලස්සනයි

පරිසරය හැඩවෙලා
මල් එලින් බරවෙලා
නිවහනින් නිවහනට
කොඩිවලින් සැරසිලා
දස දෙසින් රැව්දෙන්නෙ
සණ්ටාර නාදයයි
දස අතින් හමන්නේ
සිහිලැලී මඳ නලයි
සුදු වතින් සැරසිලා
තෙල් මල්ද අත දරා
උවැසි දන හද බැතින්
පිග නගති විහාරෙට
දිවි මගෙහි අනියත බව
ලෝකයට කියා දුන්
සම්බුදුන්ගෙ තෙමඟුල අදයි!

♦ **ලතිකානි මේබලා**
ජනාධිපති බාලිකා විද්‍යාලය
වලහන්දූව Sri Lanka




**Children's Corner**

### The Ape Family වානර පවුල

The apes are our nearest relatives. The common characteristics we share are the ability to walk upright, a highly developed brain and the absence of a tail. Like us apes have hands for grasping objects, but they can also do this with their feet. Swinging from bough to bough using their long arms and hook-like hands does climbing. Their legs are much shorter, and they walk in a clumsy, rolling fashion. There are four kinds of apes. The gorilla and chimpanzee are African, and the orangutan and the gibbon live in South-East Asia.

**වා**නර පවුල මිනිසාගේ කිට්ටුම නෑදෑයෝය. වලිගයක් නැතිකම, මනාව වැඩුණු මොළයක් තිබීම, හා දෙපයින් නැගී ඇවිදීම වානර මිනිස් දෙදෙනාටම පොදුය. අප වගේම වානරයින් යමක් අල්ලන්නේ අත් වලිනි. උන්ට එය පයින් ද පුළුවන. ගස්වලට නැගී කොක්කක් වැනි අතැඟිලි වලින් එල්ලී අත්තෙන් අත්තට පැද්දී ඉහළ යති. උන්ගේ දෙපා කොටය. වානරයින් වර්ග හතරකි. ගොරිල්ලා හා චිම්පන්සියා අප්‍රිකාවට අයත් වන අතර, ඔරන්ඔටන් හා ගිබන් ගිනිකොණ දිග ආසියාවට අයත්ය.

♦ *Auntie Ramani ( රමණී නැන්දා)*

### තොරණේ කතා ලස්සනයි

වෙසක් දිනය හරි අගෙයි
ගස්වල එල හට ගනියි
කුරුළු නාදෙ සුමිහිරියි
වෙසක් දිනය හරි අගෙයි

බුදු තෙමඟුල සිදුවුණා
හැම හදවත් පිබිදුණා
ගමේ සැවොම එක්වුණා
වෙසක් අසිරි සැමරුණා

වෙසක් කූඩු එළිය දෙයි
හැම ගෙදරම ලස්සනයි
තොරණේ කතා ලස්සනයි
වෙසක් දිනය අද තමයි

♦ **කසිඳු ,තුෂාන් බණ්ඩාර**
සුජාතා ම.වි.- රඹුක්කන
Sri Lanka

### වෙසක් අසිරිය පිබිදීලා



මැයි මල් පිපී සුවඳින් ගත නැහැ වීලා
හිරු රැස් මලින් මුකුලිත වී හැඩ වීලා
කුරුලන් ගයන ගී නාදය මුසු වීලා
පරිසර නිරිඳු රජකමටත් සැර සීලා

වෙසඟේ සිරිය හැම හදවතකම පිරිලා
බුදු හිමි සුවඳ දසතින් ඉතිරී ගලලා
කරුණා දහර මෙත් මුදිතාවෙන් පිරිලා
තිලොවග සමිඳු නමදිමු බැතියෙන් සැදිලා

♦ **සඳුනිකා කුෂානි උපවංශ**
ක්‍රිස්තුදේව බා : විදුහල - බද්දෙගම Sri Lanka


**BOC** ලංකා බැංකුව BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

**ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරිමේ මහඟු අවස්ථාවක් !**

✻ ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

✻ ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරිමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරිමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* HSBC, NATWEST, BARCLAYS *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

**No 1, Devonshire Square, London EC2M 4WD**
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit


# පාර්ලිමේන්තුවට පැමිණි ජෙනරාල්

**යු**ද අධිකරණය හමුවේ සිටින සරත් පොන්සේකා මහතා පාර්ලිමේන්තුවට පැමිණීම නව පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම දා විශේෂ සිදුවීමක් විය. යුද අධිකරණයේ විභාගවෙමින් පවතින නඩුවක විත්තිකරුවෙකු වී සිටින පුද්ගලයෙකු පාර්ලිමේන්තුවට පැමිණි ප්‍රථම අවස්ථාවද මෙයයි. සුදු ජාතික ඇඳුමකින් සැරසුණු සරත් පොන්සේකා මහතා පාර්ලිමේන්තු ගොඩනැගිලි සංකීර්ණය වෙත කැඳවාගෙන එනු ලැබවේ හමුදා ආරක්ෂාව ද ඇතිවය. පාර්ලිමේන්තු අභ්‍යන්තරයේ දී නිදහස් පුද්ගලයෙකු සේ හැසිරුණු ඒ මහතා රජයේ හා විපක්ෂයේ නවකයන්ට මෙන්ම ජ්‍යෙෂ්ඨයන්ට ද අතට අතදී සුබ පැතුවේය.

ජනතා විමුක්ති පෙරමුණේ ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රී විජිත හේරත් මහතා සහ පත්කළ මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා සමග උදේ **8.35** ට පමණ පාර්ලිමේන්තු සභා ගර්භයට පැමිණි ෆොන්සේකා මහතා ගැලරියේ සිටි පිරිසකට අතවනා ආචාර කළේය. පාර්ලිමේන්තුවේ ඉදිරි පෙළ අසුන්ගත් ඔහු චකිතයකින් තොරව සිටි අතර ඔහුගේ ආසනය ඉදිරිපසින්ම මහජන ගැලරියේ අනෝමා පොන්සේකා මහත්මිය සහ ඇයගේ සොහොයුරිය අසුන්ගෙන සිටියහ. සරත් පොන්සේකා මහතා පාර්ලිමේන්තුවට පිවිසීම විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ හා මාධ්‍යවේදීන්ගේ විශේෂ අවධානයට යොමුව තිබුණි. නව පාර්ලිමේන්තුවේ කතානායකවරයා වශයෙන් නිතරඟයෙන් පත්වූ චමල් රාජපක්ෂ මහතාට සුභාශිංසනය කරමින් කතාකළ ජෙනරාල් සරත් ෆොන්සේකා මහතා කළ සම්පූර්ණ කතාව මෙසේය.



**සරත් ෆොන්සේකා මහතා පාර්ලිමේන්තුව තුළදී**

" ඔබතුමා මේ ගරු සභාවේ නායකයා හැටියට පත්වීම ගැන අපගේ පක්ෂය වෙනුවෙන් හෘදයාංගම සංතෝෂය ප්‍රකාශකරන අතර ඔබතුමාගේ කායඹිභාරය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි කියා මා මේ අවස්ථාවේ ප්‍රාර්ථනාකරනවා. මේ රටේ දේශපාලනයේ තීරණාත්මක අවධියක මේ රට ගමන්කරන කාල පරිච්ඡේදයක ඔබතුමාට ඔය ආසනයේ හිඳගෙන කරන්නට ඇති සේවය ඉතා භාරදූරයි. විශාලයි. එම සේවය අපක්ෂපාතීව සාධාරණව රට වෙනුවෙන් ඉෂ්ට කරාවිය, ඉෂ්ටකරන්නට ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනාකරනවා. ඔබතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදායන් සහ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වාදය ආරක්ෂාකරමින්, ඔබතුමාගෙන් ඉටුවිය යුතු සේවය ඉෂ්ටකරාවිය කියන විශ්වාසය අප තුළ රඳා පවතිනවා. රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිපත්ති රැකීම ආරම්භ විය යුත්තේ මේ ස්ථානයෙන්. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ප්‍රතිපත්ති වන සියළු දෙනාගේම නිදහස, සියළුම පුරවැසියන්ට සමාන අයිතිවාසිකම් තිබීම, සියළුම දෙනාගේ මානුෂික අයිතිවාසිකම් රැකගැනීම, සියළුම දෙනාට සාධාරණත්වය ඉෂ්ටවීම, රටේ නීතියේ නිදහස ආරක්ෂාකිරීම ආදී මේ කරුණු මේ සභාවෙන් පටන් ගෙන රටපුරා සාර්ථකව මහජනයාගේ අභිප්‍රායයන් ඉෂ්ට කරමින් ක්‍රියාවේ යෙවීම සඳහා මේ සභාවට ඔබතුමා නායකත්වය දේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මහජනයාගේ නිදහස මේ අවස්ථාවේ ඉතාවැදගත්. මහජනයාට තිබිය යුතු අයිතිය, කතාකිරීමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, වෙනත් දේශපාලන අදහස් දැරීමේ අයිතිය, ඇසුරුකිරීමේ අයිතිය, අනවශ්‍ය නීති විරෝධී හිර අඩස්සිවලට පත් නොවී සිටීමට මනුෂ්‍යයින්ට ඇති අයිතිය, ආදී මෙවැනි දේවල් ආරක්ෂාකිරීමට ඔබතුමා මෙම සභාවේ කටයුතු කරනවා ඇතැයි කියලා අපි බලාපොරොත්තු වෙනව.

මමත් මේ අවස්ථාවේ එවැනි අසාධාරණකම් වලට ගොදුරක් වෙලා ඉන්න පුද්ගලයෙක් හැටියට පළවෙනි වතාවට මේ ගරු සභාවට ඇතුළත්වෙලා ඔබතුමා ඉදිරියේ මෙසේ කතා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනව. මේ අවස්ථව මට ලබාදීම ගැන මෙහි සිටින රජයේ සහ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් සියළු දෙනාට මගේ ප්‍රශංසාව සහ මගේ ගෞරවය පුදකරනවා. රට වෙනුවෙන්, රටේ ජනතාව වෙනුවෙන් ඔබතුමා සාධාරණව ඉෂ්ටකරන ඕනෑම සේවයකට, රාජකාරියකට අපගේ සම්පූර්ණ සහයෝගය ලබාදෙන වග මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමතියි.

ඔබතුමාට ජය පතන අතර, ගරු අගමැතිතුමාට, එතුමාගේ නව නිලයේ රාජකාරි කිරීමට අපේ ආශීර්වාදය ප්‍රකාශකරනවා. සියළුම ලක්වැසියනට ජයපතමින් මම නිහඬ වෙනවා."

## කාටවත් කිසිදා නැසුණු කවියක් !

මා වැනි බිරින් දා
වර වර ළඟට කැන් දා
සවුදියට යන දා
අසන සැමියෝ
වෙන කොයින් දා

♦ **උදය අමරදාස**
Texas USA




**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk